# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/12/05/02/02

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2019.12.

චක්‍රලේඛ අංක :50/2019

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම විදුහල්පතිවරුන් වෙත,

<u>පාසල් උත්සව පැවැත්වීම හා පාසල් සිසුන් ප්‍රසිද්ධ උත්සව සඳහා සහභාගී කරවීම.</u>

පාසල් සිසුන් ප්‍රසිද්ධ උත්සවවලට සහභාගී කරවීම සම්බන්ධයෙන් මෙයට පෙර නිකුත් කර ඇති **2004.07.23** දිනැති **2004/28** චක්‍රලේඛය මෙයින් අවලංගු කරන අතර, පාසල්වල උත්සව පැවැත්වීම හා පාසල් සිසුන් ප්‍රසිද්ධ උත්සව සඳහා සහභාගී කරවීම සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයේ උපදෙස් මින් ඉදිරියට බලපැවැත් වේ.

**2.0** පාසල්වල විවිධ කරුණු අභිමුඛ කර ගනිමින් උත්සව පවත්වනු ලබන අතර, බාහිර ආයතන හා සංවිධාන මඟින් මෙහෙයවනු ලබන වැඩසටහන් සඳහා ද පාසල් සිසුන් යොදවා ගනු ලැබේ. ඇතැම් උත්සව පැවැත්වීම හේතුවෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බාධා පැමිණෙන බවත් සිසු විනය සම්බන්ධ ගැටලු ඉස්මතු වන බවත් විවිධ පාර්ශ්වවලින් මෙම අමාත්‍යාංශයට වාර්තා වී ඇත.

එබැවින්, පාසල්වල පවත්වනු ලබන උත්සව මෙන් ම බාහිර පාර්ශ්ව සංවිධානය කරනු ලබන විවිධාකාර උත්සව හා ප්‍රදර්ශන සඳහා පාසල් සිසුන් සහභාගී කරවීම තව දුරටත් විධිමත් කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු ය.

**2.1** පාසල්වල පවත්වන උත්සව

මේ යටතේ ක්‍රීඩා උත්සවය, ත්‍යාග ප්‍රදානෝත්සවය, විවිධ ප්‍රසංග ආදිය ප්‍රධාන වන අතර, ඒවායෙහි දී පවත්වනු ලබන කතා සීමිත විය යුතු ය. විශේෂයෙන් ම ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී විදුහල්පති වාර්තාව, ප්‍රධාන අමුත්තාගේ කතාව හා ප්‍රධාන ශිෂ්‍ය නායකයා/නායිකාවගේ ස්තුති කතාව මෙයින් අවධාරණය කෙරේ. එමෙන් ම, ප්‍රධාන වේදිකාවේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා හා නායිකාව අසුන් ගැන්වීම අතිශය වැදගත් වේ.

තව ද, පාසල් උත්සවවල දී සිසුන්ගේ සහ අනෙකුත් සහභාගීවන්නන්ගේ කාලය පිළිබඳ සැලකිලිමත් වෙමින් මනා අයුරින් කෙටියෙන් සංවිධානය කිරීමටත්, අධ්‍යාපනික අංග සඳහා මූලිකත්වය ලබා දෙමින් උත්සවය ආරම්භයේ දී ජාතික ගීය ගායනා කිරීමටත් උත්සවය අවසානයේ දී පාසල් ගීය ගායනා කිරීම සඳහා ද කටයුතු කළ යුතු ය. එමෙන් ම, රේඛීය අමාත්‍යාංශයේ හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ අවසරය නොමැතිව උත්සව සඳහා සිසුන් මඟින් මුදල් එකතු නොකළ යුතු අතර උත්සව කටයුතු අවම පිරිවැයකින් සිදු කිරීමට සැලකිලිමත් විය යුතු ය.

ත්‍යාග ප්‍රදානෝත්සවය හා ක්‍රීඩා උත්සවය හැර පාසලේ පවත්වනු ලබන අනෙකුත් උත්සව පැයකට (01) සීමා විය යුතු අතර, සිසුන්ගේ කුසලතා වර්ධනය වන පරිදි එම උත්සවවල මෙහෙයුම් කටයුතු සිසුන්ට පැවරීම අනිවාර්යය වේ.


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

2.2 පාසල් සිසුන් සහභාගී වන වෙනත් ප්‍රසිද්ධ උත්සව

(අ) රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සංවිධානය කරනු ලබන අධ්‍යාපන උත්සව

i. ජාතික/ පළාත් ක්‍රීඩා උළෙල
ii. ජාතික මට්ටමේ/ පළාත් මට්ටමේ සංස්කෘතික උත්සව
මෙම උත්සව සංස්කෘතික අමාත්‍යාංශය/ අධ්‍යාපන අමාත්‍යාංශය/ පළාත් සංස්කෘතික අමාත්‍යාංශය/ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සංවිධානය කරන ඒවා විය යුතු යි.
iii. රේඛීය අධ්‍යාපන ලේකම්ගේ/ පළාත් අධ්‍යාපන ලේකම්ගේ/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ එකඟත්වය ඇති ව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් සංවිධානය කරනු ලබන නිදහස් දින උත්සව, සංස්කෘතික උත්සව
iv. අතිගරු ජනාධිපතිතුමා/ ගරු අග්‍රාමාත්‍යතුමා/ ගරු අධ්‍යාපන අමාත්‍යතුමා/ පළාත් ආණ්ඩුකාරතුමා/ පළාත් ප්‍රධාන අමාත්‍යවරයා සහභාගී වන හෝ රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය/ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/ හෝ රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා සංවිධානය කරනු ලබන නිදහස් දින උත්සව, සංස්කෘතික උත්සව යනාදිය
v. විදේශ රාජ්‍ය නායකයින් සහභාගී වන උත්සව - මෙම උත්සව අවස්ථාවල දී පමණක් සීමිත සිසු කණ්ඩායම් සහභාගී කරවීමට හැකි ය.

(ආ) රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය/ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තු බලධාරීන් අනුමත වෙනත් උත්සව

3.0 ප්‍රදේශයේ විවිධ සංවිධාන විසින් මෙහෙයවනු ලබන ආයතන හා සංගම් විසින් පාසල් සිසුන් යොදා ගෙන කරනු ලබන අධ්‍යාපනයට අදාළ නොවන නේවාසික හෝ නේවාසික නොවන වැඩසටහන්වලට සිසුන් සහභාගී කරවීම නොකළ යුතු ය. මෙයට අතිරේක ව විවිධාකාර පුද්ගලයින් පිළිගැනීම සඳහා සිසුන් මග දෙපස රැස්කර තැබීමත්, අරමුදල් රැස්කිරීම හෝ වෙනත් ප්‍රචාරක කාර්යය සඳහා සිසුන් සහභාගී කරවා ගැනීමත් නොකළ යුතු වේ.

4.0 යම් රාජ්‍ය ආයතනයක් හෝ වෙනත් පිළිගත් සංවිධානයක් විසින් සිසුන් උත්සව සඳහා සහභාගී කරවා ගැනීමට කටයුතු කරන විට දී ඔවුන් සඳහා අවශ්‍ය කරනු ලබන ප්‍රවාහන, ආහාර, සෞඛ්‍ය හා ආරක්ෂාව ඇතුලු සියලු පහසුකම් සැපයීමට සංවිධායකයන් විසින් කටයුතු කළ යුතු වේ.

5.0 මෙයට අතිරේක ව පාසල් තූර්යවාදක කණ්ඩායම් සහභාගී කරවීම ද පහත සඳහන් අවස්ථාවලට පමණක් සීමා විය යුතු ය. මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 1995/25 චක්‍රලේඛය තව දුරටත් බලපැවැත්වෙන බව අවධාරණය කරමි.

(අ) තම පාසලේ පවත්වන උත්සව

(ආ) රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සංවිධානය කරනු ලබන අධ්‍යාපන උත්සව

i. ජාතික/ පළාත් ක්‍රීඩා උළෙල
ii. ජාතික මට්ටමේ/ පළාත් මට්ටමේ සංස්කෘතික උත්සව/ ආගමික උත්සව
මෙම උත්සව සංස්කෘතික දෙපාර්තමේන්තුව හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය සංවිධානය කරන ඒවා විය යුතු ය.
iii. රේඛීය අධ්‍යාපන ලේකම්ගේ/ පළාත් අධ්‍යාපන ලේකම්ගේ/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ එකඟතාවය ඇති ව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් සංවිධානය කරනු ලබන නිදහස් දින උත්සව, සංස්කෘතික උත්සව
iv. අතිගරු ජනාධිපතිතුමා/ ගරු අග්‍රාමාත්‍යතුමා/ ගරු අධ්‍යාපන අමාත්‍යතුමා/ පළාත් ආණ්ඩුකාරතුමා/ පළාත් ප්‍රධාන අමාත්‍යවරයා සහභාගී වන හෝ රේඛීය අමාත්‍යාංශය හෝ රජයේ දෙපාර්තමේන්තු සංස්ථා සංවිධානය කරනු ලබන නිදහස් දින උත්සව ආගමික සංස්කෘතික උත්සව යනාදිය
v. විදේශ රාජ්‍ය නායකයින් සහභාගී වන උත්සව

6.0 මෙයින් පරිබාහිර ව වෙනත් අවස්ථා සඳහා පාසල් තූර්ය වාදක කණ්ඩායම් සහභාගි කරවීමට කටයුතු නොකළ යුතු බව අවධාරණය කරමි.

7.0 මෙම කරුණුවලට අමතර ව පාසල් තුළ පැවැත්වෙන උදෑසන රැස්වීම සම්බන්ධයෙන් ද ඔබගේ අවධානය යොමු කරමි.

උදය රැස්වීම මඟින් පාසලක සිසුන් අතර එක්සත් බව හා එක්සිත් බව තහවුරු කිරීමට උපකාරී වන අතර මනා ලෙස සංවිධානය වූ උදෑසන රැස්වීමක් මඟින් දේශානුරාගී හැඟීම් හා උසස් ගුණාංග කුඩා කළ සිට ම පුරුදු පුහුණු කිරීම සඳහා ද ආගමික පසුබිමක් ඇති කිරීම සඳහා ද ඉවහල් වේ. සෑම පාසලක ම දෛනික වැඩ ආරම්භ කිරීමට පෙර ගුරු මණ්ඩලයේ හා සිසු සිසුවියන්ගේ සහභාගීත්වයෙන් ආගමික වතාවත් පවත්වා උදෑසන රැස්වීම පැවැත්විය යුතු ය. පාසලේ ඉඩ-කඩ හා සම්පත් සීමිත නම් අංශ මට්ටමින් උදෑසන රැස්වීම පැවැත්විය හැකි ය. ආගමික වතාවත්වලින් අනතුරුව විදුහල් ගීතය ගායනය කළ යුතු අතර විදුහල්පති හෝ ගුරුභවතෙකු විසින් උපදේශාත්මක දේශනයක් පැවැත්විය යුතු ය. උදෑසන රැස්වීම සඳහා විනාඩි 15ක පමණ කාලයක් වෙන් කිරීම ප්‍රමාණවත් ය. මෙම වැඩපිළිවෙළ අප්‍රමාද ව ක්‍රියාත්මක කිරීමේ අපහසුවක් වේ නම් විදුහලේ පවතින පහසුකම් ගැන සලකා උදෑසන රැස්වීම සංවිධානය කිරීම විදුහල්පති සතු වගකීමකි.

8.0 අඟහරුවාදා, බ්‍රහස්පතින්දා හා සිකුරාදා යන තෙදින තුළ දී විදුහලේ සියලු සිසුන් සඳහා විනාඩි 10කට නොවැඩි කාලයක් තුළ ශාරීරික සුවතා අභ්‍යාස මාලාවක් පැවැත්වීමට කටයුතු කළ යුතු වේ. මේ සඳහා ක්‍රීඩා ගුරුභවතෙකු නොමැති විට මේ සම්බන්ධ ව දැනුම සහිත ගුරුවරයෙකු යොදා ගත හැක.

උදෑසන රැස්වීම හා ශරීර සුවතා අභ්‍යාස සඳහා වෙන් කළ යුතු උපරිම කාලය විනාඩි 15 කට නොවැඩි විය යුතු ය.

9.0 දවස අවසානයේ දී සිසුන් පන්ති කාමරවලින් පිට වීමේ දී පන්තියේ අවසාන කාල පරිච්ඡේදයේ ඉගැන්වීමේ නිරත ව සිටි ගුරුභවතුන් විසින් තම පන්ති කාමරයේ සිසුන් ආගම සිහි කර විනීත ආකාරයෙන් පන්ති කාමරයෙන් පිටත් වනවා ද යන්න පිළිබඳ ව අවධානයෙන් යුතු ව කටයුතු කළ යුතු ය.

මෙම චක්‍රලේඛයෙන් පැන නගින ඕනෑ ම ගැටලුවක් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

එන්.එච්.එම්. චිත්‍රානන්ද
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:-

1. විගණකාධිපති
2. පළාත් ප්‍රධාන ලේකම්වරුන්
3. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
4. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
5. විභාග කොමසාරිස් ජනරාල්
6. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
7. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම මාණ්ඩලික නිලධාරීන්
8. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම ශාඛා ප්‍රධානීන්